DOI: 10.31357/fhssmst.2005.00014

# 19 වන ශත වර්ෂයේ පද්‍ය සාහිත්‍යයේ නවාංග පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය ඔලගන්වත්තේ චන්දසිරි හිමි

ලේඛ්‍යාරූඪ අංකය GS/HU/922/2000

ශාස්ත්‍රපති 2005

## පර්‍යේෂකයාගේ ප්‍රකාශය

19 වන ශත වර්ෂයේ පද්‍ය සාහිත්‍යයේ නවාංග නැමැති මේ නිබන්ධය, මා විසින් ස්වාධීන ව පර්යේෂණය කරනු ලැබ සම්පාදනය කරන ලද්දක් බව සහතික කරමි.

පූජ්‍ය ඔලගන්වත්තේ චන්දසිරි හිමි

## උපදේශකගේ ප්‍රකාශය

19 වන ශත වර්ෂයේ පද්‍ය සාහිත්‍යයේ නවාංග නමැති මේ නිබන්ධය, අපගේ උපදේශකත්වය යටතේ පූජ්‍ය ඔලගන්වත්තේ චන්දසිරි හිමියන් විසින් ස්වාධීන ව පර්යේෂණය කරනු ලැබ සම්පාදනය කරන ලද්දක් බව සහතික කරමි.

ති. ක. කාරියවසම්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම්
6/12/05

# 19 වන ශත වර්ෂයේ පද්‍ය සාහිත්‍යයේ නවාංග පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය ඔලගන්වත්තේ චන්දසිරි හිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයෙහි
ශාස්ත්‍රපති (සිංහල) උපාධි පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

# පටුන


**පළමු වන පරිච්ඡේදය : එකුන් විසිවන සියවසේ සමාජ ආර්ථික හා ඓතිහාසික පසුබිම** 1 - 17

1.1 රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හා වතු ආර්ථිකය ආරම්භය

1.2 කුලය පංතිය හා ඉංග්‍රීසි අධ්‍යාපනය

1.2.1 ඉංග්‍රීසි අධ්‍යාපනය

1.3 මිෂනාරි ව්‍යාපාරය ආරම්භය කිරීම හා මුද්‍රණාලය පවත්වාගෙන යාම

1.4 නව සාහිත්‍ය ව්‍යාපාරයක උදාව

**දෙවන වන පරිච්ඡේදය: නව සිංහල පද්‍ය සම්ප්‍රදායට මග පෑදීම** 18 - 46

2.1 සරණංකර සංඝරාජ සාහිත්‍ය ප්‍රබෝධය දක්වා සිංහල පද්‍ය සම්ප්‍රදාය

2.2 සරණංකර සාහිත්‍ය ප්‍රබෝධය හා තත් ශිෂ්‍ය පරම්පරාවන්හි සාහිත්‍ය සේවාව

2.2.1 19 වන ශත වර්ෂයෙහි සරණංකර හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවේ ක්‍රියාකාරිත්වය

2.3 සව්සත්දම්වාදය , තදාශ්‍රිත සාහිත්‍ය ප්‍රබෝධය කෙරෙහි බල පෑ ආකාරය

2.3.1 සව්සත්දම්වාදය

2.3.2 පද්‍ය සාහිත්‍ය කෙරෙහි ඇති කරන ලද බල පෑම

**තුන් වන වන පරිච්ඡේදය : පුවත්පත් කාව්‍ය සම්ප්‍රදය** 47 - 65

3.1 විවිධ පුවත්පත් හා සඟරා

3.2 පුවත්පත් හා සඟරාවල අන්තර්ගතය

3.3 විවිධ පද්‍ය වර්ග හා ඒවායේ අන්තර්ගතය

3.3.1 ප්‍රභූ ආශිර්වාද

3.3.2 මරණ

3.3.3 පුද්ගල විවේචන

3.3.4 කවි ගැටලු

3.3.5 අභිනව කාව්‍ය ග්‍රන්ථ ප්‍රචාරය

3.4 සඟරා

3 5 විරිත හා කාව්‍යාලංකාරාදිය

**හතර වන පරිච්ඡේදය: නව කාව්‍ය සම්ප්‍රදායේ විශේෂතා** 66 - 122

4.1 වස්තු විෂය

4.2 පිංකම් හා ස්ථාන වර්ණනා

4.3 ජාතක කාව්‍යය

4.4 ශෘංගාරාත්මක පද්‍ය හා විරාහාලාප

4.5 සමකාලීන භික්ෂු සංස්ථාව අරභයා රචිත කාව්‍ය

4.6 දෙව්රද වර්ණනා

4.7 රාජ චරිත වර්ණනා

4.8 විදේශීය කුමාරවරුන්ගේ පැමිණීම්

4.9 සමාජ සිද්ධි වර්ණනා

4.10 පුද්ගල වර්ණනා

4.11 සමාජ උපදේශ කාව්‍ය

4.12 සන්දේශ

4.13 නාට්‍ය වර්ණනා

4.14 ස්ථාන වර්ණනා

4.15 දරු නැලවිලි පද්‍ය

4.16 මාල කාව්‍ය

4.17 ක්‍රිස්තියානි ගීතිකා

4.18 මාර්ග වර්ණනා

4.18.2 දුම්රිය මාර්ග

4.18.1 මහා මාර්ග

**පස් වන පරිච්ඡේදය: නව පද්‍ය කාව්‍ය සම්ප්‍රදාය විචාරය** 123 - 155

5.1 වස් දොස් හැරීම

5.2 කාව්‍ය දෝෂ මග හැරීම

5.3 බණ ඇසීම

5.4 භාෂා භාවිතය හා නව ප්‍රවණතා

**සමාලෝචනය හා නිගමනය**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

# උපකාරානුස්මෘතිය

ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතා සම්පූර්ණ කරනු වස් ලිඛිත පරීක්ෂණය හා පර්යේෂණ සම්මන්ත්‍රණ පත්‍රිකාත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව "19 වන ශතවර්ෂයේ පද්‍ය සාහිත්‍යයේ නවාංග" නැමති පර්යේෂණ මාතෘකාව අප වෙත ලබා දෙමින් මෙහි ආරම්භක අවස්ථාවේ සිට අවසන් වන තෙක් මාගේ උපදේශක ලෙස කටයුතු කළාහු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් සූරීහු ය. එතුමන්ගෙන් ලැබුණු ශාස්ත්‍රෝපදේශ සම්බන්ධයෙන් භක්ත්‍යාදර පූර්වක කෘතඥතාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගනුම්හ.

විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථියකු වසයෙන් අප අධ්‍යයන කටයුතු කරන අවදියේ පටන් නිවැරදි ශාස්ත්‍ර ඥානය අප වෙත ප්‍රදානය කරමින් මග නොමග කියා දෙමින් සියලු කුඩු මහත් කටයුතුවල දී අපට මහත් සේ උපකාර කළ හා උපකාර කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රත්නසිරි අරංගල ඇදුරුතුමා මාගේ විශේෂ සම්භාවනාවට පාත්‍ර වුව මනා ය. රාජකාරි ජීවිතයේ දී ඇති වූ නොයෙකුත් දුක්ඛ දොම්නස්සවල දී අප හට මා පිය සේ නිති රැකවරණය හා චිත්ත ධෛර්යය ලබා දෙමින් කටයුතු කළාහු ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. එන්. ධර්මරත්න හා මානව ශාස්ත්‍රාංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තිස්ස වීරසේකර සුධීමත්හු ය. ජීවිතයට ආලෝකය ලබා දුන් හිටපු උපකුලපති මහාචාර්ය කේ. විජේරත්න මහතාටත් ශාස්ත්‍රීය කටයුත සඳහා සදුපදේශයන් ලබාදෙන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ. ලගමුව මහතාටත් පුණ්‍යානුමෝදනා කරම්හ. කථිකාචාර්ය පින්නවල සංඝසුමන හිමි හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝජ් ආරියරත්න හිතෛෂීන් අපට දැක්වූ ළබැඳි සහෝදරත්වය කිසි දා අමතක නොවනු ඇත. ශාස්ත්‍රීය ලෝකයක් ගොඩ නගන්නට නිරන්තරයෙන් ම අපව දිරිමත් කරන සේවාර්පිත මහාචාර්ය විමල් ජී. බලගල්ලේ හා මහාචාර්ය රත්න විජේතුංග ඇදුරුතුමන් දෙපළ ද අපගේ ගෞරව බහුමානනයට පාත්‍ර වෙති. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පොත් ගුලෙහි නිශ්ශංක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ජාතික කෞතුකාගාර පුස්තකාලයයේ හා ජාතික ලේඛනාරක්ෂක දේපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයන්හි ලොකු කුඩා හැම දෙනාටමත් පුණ්‍යානුමෝදනා කරම්හ. ශාසනික කටයුතු හා පිළිවෙත් අධ්‍යයන කටයුතු හේතුවෙන් අතපසුවීම් මහත් සානුකම්පිතව ඉවසා වදාරන හා මාගේ අධ්‍යයන කටයුතුවලට පමණක් නොව මාගේ ශාස්ත්‍රීය ඉදිරි ලෝකය දකින්නට පෙරුම් පුරන්නේ මාගේ දෙවන පියා වූ මාතලේ මහනුවර දෙදිසාවේ ප්‍රධාන සංඝ නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ගෞරවාර්හ තිස්මඩ නන්දාරාම මාගේ ගුරුදේවයන් වහන්සේ ගෞරව පූර්වක ව සිහිපත් කරනුයේ දීර්ඝායුෂ ප්‍රාර්ථනා සිතිනි. මෙම කාර්යෙහි ලා අපට උපකාර කළා වූ සැම දෙනාට ම පුණ්‍යාමෝදනා කරම්හ.

# හැඳින්වීම

එකුන් විසි වන සියවසෙහි මුද්‍රණයෙන් ප්‍රකාශිත කාව්‍ය ග්‍රන්ථ අතුරින් තෝරා ගත් පද්‍ය කෘති සියයකට අධික ප්‍රමාණයක් පාදක කර ගනිමින් චිරන්තන කාව්‍ය මාර්ගයට අන්‍යතර නව කාව්‍යාංග එහි දක්නට ලැබේ ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. තත් කාව්‍යාංගයන්හි ආකෘතිය, භාෂාව හා සංස්ථිතිය කෙසේ ගොඩ නැඟී ඇත් ද යන්න විමසීම ද මෙහි ලා අභිප්‍රේත යි.

ආරම්භයේ දී බෞද්ධාගමික සාහිත්‍යයක් වූ සිංහල පද්‍ය සාහිත්‍යය යුරෝපීයයන්ගේ පැමිණීම හේතු කොට ගෙන සිදු වූ සමාජ විපර්යාසයන්හි ප්‍රතිඵලයක් වසයෙන් නව මුහුණුවරක් ප්‍රකට කරන්නට විය. ක්‍රිස්තියානි මිෂනාරීන් විසින් ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණින් ස්ථාපනය කරන ලද මුද්‍රණාලය එකුන් විසි වන ශත වර්ෂයේ මධ්‍ය භාගයෙන් පසු ව අභිනව සාහිත්‍ය ව්‍යාපාරයක් ගොඩ නැඟීම සඳහා හේතු වූ අයුරු දක ගත හැකි ය. එකුන් විසි වන සියවසෙහි මුද්‍රණාලය බිහි වීමත් පුවත් පත් හා සඟරා මඟින් ශාස්ත්‍ර සන්තතියක් ආරම්භ කොට පවත්වා ගෙන යාමට හැකි වීමත් මෙහි ලා විශේෂ අවධානය යොමු විය යුතු කරුණු ය. දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල පිහිටි මුද්‍රණාලය මගින් ප්‍රකාශිත කෘති අතර පද්‍ය ග්‍රන්ථ ද විය. පුවත්පත් හා සඟරා ඇති වීමත් සමඟ ඒවායෙහි පළ කිරීම සඳහා කවි ලියන්නන්ගේ සංඛ්‍යාව ද වැඩි විය. මේ යුගය තුළ ''කවි'' නමින් පළ වූ පද්‍ය රචනා හා පද්‍ය ග්‍රන්ථ අතිවිශාල ප්‍රමාණයක් දක ගත හැකි ය. මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම ආර්ථික වසයෙන් විශාල ලාභයක් ඉපයිය හැකි මාර්ගයක් ලෙස සිතූ මෙම ව්‍යාපාරිකයෝ ආගමික කෘතීන් මුද්‍රණය හා ප්‍රකාශනය වෙනුවට නවතම කෘතීන් හා ලේඛකයන් සෙවූහ. මෙම වැඩ පිළිවෙළ සිංහල කාව්‍ය ක්ෂේත්‍රය පොහොසත් කිරීමට පමණක් නොව නව කාව්‍ය කෙරෙහි උනන්දුවක් දක්වූ පාඨක පිරිසක් ගොඩ නැඟීමට ද හේතු විය. මහා සම්ප්‍රදායට අන්‍යතර පද්‍යයෙන් රචනා වූ කුඩා ලියුම් මෙන් ම එදිනෙදා ජීවිතයේ දක්නට ලැබෙන සිද්ධීන් පසුබිම් කොට රචනා වූ කුඩා කාව්‍ය මගින් සාම්ප්‍රදායික කාව්‍ය මාර්ගයට වෙනස් මුහුණුවරක් ගත් කාව්‍ය සම්ප්‍රදායක ආරම්භය ද මෙම පසු බිම තුළ දක ගත හැකි යි.

මෙම පර්යේෂණයට ඍජු ලෙස ම අදාළ වනුයේ එකුන් විසි වන සියවසේ මුද්‍රණ ශිල්පය ඇති වීමත් සමඟ ප්‍රකාශයට පත් වූ පද්‍ය පුස්තිකා වේ. සිංහල සාහිත්‍යය ආරම්භයේ පටන් ම බෞද්ධ සාහිත්‍යයක් විය. එහි ගමන් මඟ සකස් වූයේ පාලි හා සංස්කෘත ආශ්‍රයෙනි. සංස්කෘත පද්‍ය සාහිත්‍යයෙහි අනුශාඛාවක් සේ වර්ධනය වූ සිංහල පද්‍ය සාහිත්‍ය පවා කාව්‍ය වස්තුව සඳහා ජාතක පොත කරා යොමු වීමෙන් බෞද්ධ මුහුණුවරක් අත්පත් කොට ගත්තේ ය. සොළොස්

වන සියවසේ දී පෘතුගීසින්ගේ ආභාසයත් බුදු සමයෙන් අන්‍ය ලබ්ධියක් ප්‍රචාරය කරනු වස් ග්‍රන්ථ සම්පාදනය හේතුවෙන් සිංහල සාහිත්‍යයෙහි ගමන් මඟ වෙනස් විය.

එකුන් විසි වන සියවසේ ආරම්භ වී ඇති සිංහල පද්‍ය සාහිත්‍යය අන්තර්ගතය, සංස්වීතිය, කාව්‍ය මාර්ගය චිරන්තන සිංහල සාහිත්‍යයෙන් අන්‍යතර වූවකි. එය පැහැදිලි ලෙස ම එකුන් විසිවන සියවසේ ඇති වූ සමාජ සංස්ථාවන්හි වෙනස් වීම හා සරණංකර හිමියන් ඇරඹූ ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථාන ව්‍යාපාරයෙහි සෘජු ප්‍රතිඵල වේ. සරණංකර හිමියන් විසින් ආරම්භ කරන ලද ශාස්ත්‍රීය ව්‍යාපාරය චිරන්තන සාහිත්‍යය යම් තාක් දුරට නඟා සිටුවීමටත් නව පද්‍ය සාහිත්‍යයක ආරම්භයටත් අවශ්‍ය පසුබිම සකස් කළ බව පෙන්වා දිය යුත්තකි.

19 වන ශතවර්ෂය තෙක් සාහිත්‍ය කලාව පණ්ඩිත ජනයා අත වඩාත් භාවිතයෙහි පැවතියත් තත් කාල පරිච්ඡේදයෙහි ඇති වූ නව සමාජ උපනතීන් සමඟ සාහිත්‍ය කලා කටයුතු වඩාත් පොදු ජන ව්‍යවහාරයට පත් වීම පමණක් නොව ගෘහස්ථ ජනයා වැඩි වසයෙන් සාහිත්‍ය කටයුතුවල නිරත වීම ද විශේෂත්වයකි. මේ අවධියේ කාව්‍ය රචකයෝ සමාජ සිද්ධි මෙන් ම පුද්ගලානුභූති ද ස්වකීය නිර්මාණ සඳහා පාදක කර ගනිමින් සමාජ විවේචනයන් සිදු කිරීමට මෙන් ම සදුපදේශ ලබා දීමට ද ප්‍රෝත්සාහි වූහ. සම්භාව්‍ය සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ලත් පරිචය හා අවබෝධය ඇතැම් කවීන් සතු ව පැවතියත් මාතර අවධියේ ඇතැම් පද්‍ය රචකයන් මෙන් ඒ කෘති සෘජු ලෙස ම අනුකරණය කිරීම ද දැක ගත හැකි ය.

දිවයිනේ ව්‍යස්ථාදායක සභාවන්හි වර්ධනය, ධනවාදි ක්‍රමයේ විකාශනය හා ආර්ථික අංශයන්හි සිදු වූ උපනතීන් සම්බන්ධයෙන් මෙන් ම ලංකා අධ්‍යාපනයේ විකාසනය හා ආගමික සංස්ථාවන්හි ඇති වූ නව ප්‍රවණතා පිළිබඳ ව දේශීය හා විදේශීය උගතුන් ශාස්ත්‍රීය මට්ටමේ පර්යේෂණ ගණනාවක් සිදු කොට ඇති අතර එම පර්යේෂණ මගින් වැඩි අවධානය යොමු කොට ඇත්තේ සිංහල ගද්‍යයේ විශේෂයෙන් ම නවකතාවේ ප්‍රභවය හා තදීය සමාජ සාහිත්‍යික පසුබිම විමර්ශනය කිරීම සඳහා ය . නව පද්‍ය සම්ප්‍රදායයක ආරම්භය සම්බන්ධයෙන් සිදු කොට ඇති එක ම විධිමත් අධ්‍යයනය වූ කලි තිස්ස කාරියවසම් මහතාගේ *Religious Activities and the Development of a New Poetical Tradition in Sinhalese 1852-1906* යන අප්‍රකාශිත දර්ශන සූරි උපාධි නිබන්ධය යි. එසේ වුව ද එම අධ්‍යයනයෙහි පවා වඩා අවධානය යොමු නොවූ කාව්‍ය කෘතීන්හි අන්තර්ගතය පිළිබඳ ව විමසා බැලීම මෙහි දී සිදු කර ඇත.

එකුන් විසි වන සියවසෙහි මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත වෙත් ම මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති පුරාතන හා නූතන කෘති විශාල ප්‍රමාණයක් අතුරෙන් 1850-1900 අතර කාල පරිච්ඡේදයෙහි ප්‍රකාශයට පත් වී දැනට කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි තැන්පත් කොට ඇති පද්‍ය ග්‍රන්ථ අතුරෙන් තෝරා ගත් පද්‍ය කෘති මෙහි ලා ප්‍රධාන මූලාශ්‍රය ලෙස භාවිත කෙරේ. මුද්‍රණාලය ස්ථාපණය වීමත් සමඟ අභිනවයෙන් ප්‍රකාශයට පත් වී ඇති පද්‍ය පුස්තිකා එකතුවක් ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි හැරෙන්නට වෙනත් ස්ථානයක දී සොයා

ගැනීම දුෂ්කර බව ද මෙහි ලා සඳහන් කළ යුතු වේ. මෙහි ලා අපගේ විමර්ශනයට භාජනය වූ බොහෝ පද්‍ය කෘති වෙනත් පර්යේෂකයන්ගේ අවධානයට යොමු නොවී පැවති බවක් අපට පසක් විය. ප්‍රකාශයට පත් වී ඇති පුස්තිකා විධිමත් ලේඛන ගත කිරීමක් සිදු කොට නොමැති අතර ම වර්ෂයකට පමණ පෙරාතු ව පරිශීලනය කරන ලද ඇතැම් කෘති ද මේ වන විට අස්ථානගත වීම හේතුවෙන් නැවත පරිශීලනය කිරීමේ දී යම් යම් දුෂ්කරතා මතු වූ බව ද මෙහි ලා සඳහන් කළ යුතු වේ. මෙම කෘති පරිශීලනය කිරීමේ දී වැඩි කාලයක් ඒ වෙනුවෙන් කැප කිරීමට සිදු වූයේ ද ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි පැවති යම් යම් අවහිරතා නිසා බව ද සඳහන් කළ යුතු ය. පුවත්පත් පරිශීලනය කිරීමේ දී ඇතැම් පුවත්පත් සූක්ෂ්ම පටිගත කිරීම් සිදු නොකොට ඇති අතර ම පටිගත කරන ලද ඇතැම් පුවත්පත් ද පරිශීලනය කිරීම අපහසු බව සඳහන් කළ යුත්තකි.

මේ අතුරින් ඇතැම් කෘතිවල කර්තෘ නාමය සොයා ගත නොහැකි අතර ඇතැම් කෘතියක ග්‍රන්ථ අභ්‍යන්තරයෙන් හෝ කර්තෘ නාමය අනාවරණය නොවන බව කිය යුතු ය. ඇතැම් කෘතියක මුද්‍රිත මුල් පිටු දකගත නොහැකි බව ද සඳහන් කළ යුතු වේ. තවත් කෘතියක දක්නට ඇත්තේ ප්‍රකාශකයාගේ හෝ අනුග්‍රහකයාගේ නාමය වේ. අපගේ විමර්ශනයට ලක් වන පද්‍ය කෘතීන්හි ප්‍රමාණය පද්‍ය බොහෝ විට දෙසියයකට වඩා අඩු වන අතර මුද්‍රිත පිටු දහයක පමණ ප්‍රමාණයක් වේ. මෙම පද්‍ය කෘති විචාරයට හෝ විමර්ශනයට ලක් කරමින් සම්පාදිත සාහිත්‍යයක් වෙතොත් එය ද මෙහි ලා මූලාශ්‍රය කරගනු ලැබේ. මුද්‍රණ ශිල්පයේ ව්‍යාප්තියත් සමඟ ප්‍රකාශයට පත් වී ඇති පුවත්පත් හා සඟරා ද මෙහි ලා භාවිත කරනුයේ එමගින් පද්‍යයෙහි නවාංග ගොඩ නැගීම සඳහා කෙතරම් පිටු වහලක් සිදු වී ඇත් දැයි විමර්ශනය කිරීම සඳහා ය. මේ මූලාශ්‍රයන් හැරෙන්නට ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ද පරිශීලනය කිරීම මූලික ව සිදු කොට ඇත.

මේ නිබන්ධනයෙහි ලා ප්‍රධාන පරිච්ඡේද පහක් යටතේ කරුණු විමර්ශනය කිරීම සිදු කොට ඇත. පළමු පරිච්ඡේදයෙහි දී එකුන් විසි වන සියවසෙහි නව සමාජ උපනතීන් ගොඩ නැගීම සඳහා ප්‍රධාන වසයෙන් හේතු වූ සමාජ ආර්ථික සාමාජික තත්ත්වය විමර්ශනය කිරීම සිදු කොට ඇත. මෙහි ලා මුද්‍රණාලය ආරම්භ වීම විශේෂ අවධානයට යොමු වූයේ එකී සාධකය මත නව සාහිත්‍යය ව්‍යාපාරයක ආරම්භය සිදු වූ බව පැහැදිලි ව ම පෙනී යන හෙයිනි.

ද්විතීය පරිච්ඡේදයේ දී සිංහල පද්‍ය සම්ප්‍රදාය ක්‍රමානුකූල ව වෙනසට භාජනය වීම විමර්ශනය සිදු කොට ඇත. විශේෂයෙන් වැලිවිට සරණංකර හිමියන්ගේ සහ උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාවේ ශාසනික හා ශාස්ත්‍රීය ක්‍රියාකාරිත්වය නූතන සාහිත්‍ය ආරම්භය තෙක් පැවතීම හේතුවෙන් ඒ පිළිබඳව ද අපගේ අවධානය යොමු විය. එකුන් විසි වන සියවසේ මහා ශාස්ත්‍රීය වාදය ලෙස සැලකෙන සව්සත් දම් වාදය මෙහි ලා සාකච්ඡාවට භාජනය වූයේ එය පද්‍ය සාහිත්‍යය කෙරෙහි විවිධ අංශවලින් බල පෑ බව පෙන්වා දීම සඳහා ය.

තෘතීය පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම වෙන් වී ඇත්තේ පුවත්පත් හා සඟරා පදනම් කර ගනිමින් ඒවායෙහි අන්තර්ගත පද්‍ය විමර්ශනය සඳහා ය. තෝරා ගත් පුවත්පත් හා සඟරා කිහිපයක පද්‍ය අපගේ විමසීමට භාජනය විය.

චතුර්ථ පරිච්ඡේදය විමර්ශනයට භාජනය වූ පද්‍ය කෘති වස්තු විෂය අනුව වර්ග කිරීම හා එම කෘතීන්හි අන්තර්ගතය අධ්‍යයනය කිරීම සඳහා වෙන් වෙයි. විශේෂයෙන් තෝරා ගත් කෘතිවල අන්තර්ගතය මෙහි ලා විමර්ශනය කර ඇත්තේ ඇතැම් පර්යේෂණයන් තත් කෘතිවල නාමය පමණක් සඳහන් කොට තිබීම නිසා ය.

පඤ්චම පරිච්ඡේදයෙහි ලා තෝරා ගත් පද්‍ය කෘතිවල අන්තර්ගතයේ විශේෂතා විමර්ශනය කිරීම සිදු කොට ඇත. විශේෂ කාව්‍ය ලක්ෂණ , භාෂා භාවිතය හා නව ප්‍රවණතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නව පද්‍යයන් විචාරයට ලක් කිරීමත් එමගින් පැනෙන විචාර සංකල්පයන් කෙරෙහිත් අපගේ අවධානය යොමු වී ඇත.

සියලු කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරු ව අපගේ ස්වාධීන නිගමනය අවසාන වසයෙන් මෙහි සඳහන් කර ඇත. මේ නිබන්ධනයෙහි ලා මූලාශ්‍රයයන් හැකුළුම් (Abbreviation) සටහන් ලෙස ද මෙහි සඳහන් කර සඳහන් කර ඇත.

## හැකුළුම් ( Abbreviation )

| | | |
|---|---|---|
| සි. ව | - | සියබස්ලකර වර්ණනාව |
| ක. සි | - | කව්සිළුමිණ |
| එ. ල | - | එළු සඳැස් ලකුණ |
| ගු. ක | - | ගුත්තිල කාව්‍යය |
| පැ. සි | - | පැරකුම්බා සිරිත |
| ස. ච | - | සංඝරාජ සාධු චරිතය |
| ග. ව | - | ගංගාරෝහණ වර්ණනාව |
| ල. ප | - | ලක්මිණි පහන |
| ස. ස | - | සරසවි සඳැරැස |
| ලං.බ්‍රි' යු | - | ලංකාවේ බ්‍රිතාන්‍ය යුගය |
| සිං . න. ඉ. වි | - | සිංහල නවකතා ඉතිහාසය හා විචාරය |
| සිං.සා.ව | - | සිංහල සාහිත්‍ය වංශය |
| සිං.සි.ස | - | සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය |
| ස.සා .ස - | - | සංඝරාජ සාධු සමය |
| සු . ස | - | සුමංගල සගරාව |
| මා . යු. සා. නි | - | මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන |
| චි.සි.වි | - | චිරන්තන සිංහල සාහිත්‍යය විචාරය චින්තනයේ විකාශනය |
| අ.භි | - | අභිනවාරාම වර්ණනාව |
| කු.පි | - | කුම්මාස පිණ්ඩ ජාතක කාව්‍යය |
| P .S .L | - | Press in Sri Lanka |
| R .D. P .S | - | Religious Activities and the Development of a new Poetical Tradition in Sinhalese 1852- 1906. |
| H .O. P | - | History of Sri Lanka |

# පළමු වන පරිච්ඡේදය

## එකුන් විසි වන සියවසේ සමාජාර්ථික හා ඓතිහාසික පසුතලය.

මේ පරිච්ඡේදය මගින් එකුන් විසි වන සියවසේ සිංහල පද්‍ය සම්ප්‍රදාය වෙනස් වීම කෙරෙහි බල පෑ සමාජ ආර්ථික හා දේශපාලනික තත්ත්වය විමසා බැලීම අභිප්‍රේත යි.

ශ්‍රී ලංකා ඉතිහාසයෙහි අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ පැවති දේශීය සමාජ ආර්ථික සංස්ථා විනාශ වීමත් 19 වන සියවසේ සිට බටහිර අධිරාජ්‍යවාදී පාලකයන් යටතේ ආරම්භ වූ සමාජ ආර්ථික ක්‍රමයක වර්ධනයත් බොහෝ දුරට සම්පූර්ණත්වයට පත් වූයේ බ්‍රිතාන්‍යයන්ගේ පාලන සමය තුළ දී ය.[1] මේ හේතුවෙන් බ්‍රිතාන්‍ය පාලන සමය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික වර්ධනයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි.[2] බ්‍රිතාන්‍යයන්ගේ පරිපාලන කටයුතු සඳහා වියදම් පියවා ගැනීමටත් දිවයිනේ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් සුදුසු වන අන්දමේ පුළුල් ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම සඳහා 1829 දී විලියම් කෝල්බෲක් සහ සී.එච් කැමරන් යන දෙදෙනාගෙන් සමන්විත කොමිසමක් පත් කොට එවන ලදි. ශ්‍රී ලංකාවේ අධිකරණය යුද්ධ ආගමික, වෙළඳ සහ දේශීය සම්පත් ආදි මේ රටට සම්බන්ධ සෑම අංශයක් පිළිබඳ ව ම පරීක්ෂා කොට බලා වාර්තා කිරීම කොමිසමට පැවරී තිබුණු ප්‍රධාන වගකීම විය. මෙයින් අධිකරණය පිළිබඳ වාර්තාව කැමරන් විසින් ඉදිරිපත් කරන ලද අතර සෙසු වාර්තා ඉදිරි පත් කරන ලද්දේ කෝල්බෲක් විසිනි. මුළු ලංකා ඉතිහාසය ම 19වන සියවස තුළ දී නව මගකට යොමු කොට ශීඝ්‍රයෙන් ඉදිරියට ගෙන යාමට හේතු වූයේ එම කොමිසම මගින් නිර්දේශ කරන ලද ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම යි.[3] ඒ නිර්දේශයන් අතුරෙන් අපගේ ප්‍රස්තුතයට ඍජු ව හෝ වක්‍ර ව හෝ බල පා ඇති සාධක විමසා බැලීම මෙහි දී සිදු කෙරේ.

රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.[4]

මිෂනාරි ව්‍යාපාරය අනුමත කිරීම.[5]

මුද්‍රණාලය පවත්වා ගෙන යාමට අවසර දීම.[6]

බෞද්ධ අධ්‍යාපනය නොතකා හැරීම.[7]

---

1. De. Silva K.M, A history of Sri Lanka, (HOP) 1981: 244.
2. Ibid : 247.
3. Ibid : 252.
4. Mendis G.C, Coolbrook Cameran Papers vol 1-11 , 1956:
5. Ibid : 73.
6. Ibid : 75.
7. Ibid : 74.

## 1.1 රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හා වතු ආර්ථිකයක ආරම්භය

රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හරහා ඇති වූ ආර්ථික වෙනස්කමත් වතු ආර්ථිකය මගින් ඉස්මතු වූ නව ධනපති පංතිය මෙන් ම ඉංග්‍රීසි අධ්‍යාපනය හරහා ද්විභාෂික උගතුන්ගේ පහළ වීමත් මෙහි දී අවධානයට ලක් කළ යුත්තකි.

දේශීය සමාජ හා අර්ථ ක්‍රමයේ වැදගත් අංශයක් වූයේ රාජකාරි ක්‍රමය යි. රාජකාරි ක්‍රමයට පදනම වූයේ රටේ සියලු ම ඉඩම් රජතුමාට අයත් ය යන පෙර පටන් පැවත එන සංකල්පය යි. මේ පදනම උඩ රාජ්‍යය තුළ ඉඩම් භුක්ති විඳින්නන් වසයෙන් රට වැසියන් ඒ සඳහා රජුට නැතහොත් රාජ්‍යයට කිරීමට බැඳී තිබුණු සේවය රාජකාරිය නමින් හැඳින්විණි. රාජකාරි ක්‍රමය පදනම් වී තිබුණේ ඉඩම් භුක්තිය හා කුල ක්‍රමය මත ය.[8] මේ රාජකාරි ක්‍රමය ප්‍රධාන අංශ දෙකකින් යුක්ත විය. එනම් ඉඩම් භුක්ති ක්‍රමය හා අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යි.[9] රාජකාරි ක්‍රමය තුළ අන්‍යෝන්‍ය යුතුකම් හා අයිතිවාසිකම් ඉටු වූ අතරම එම පදනම සුඛිත මුදිත සමාජයක් ගොඩ නගා ගැනීම සඳහා හේතු විය.[10] 1832 සිට රාජකාරි ක්‍රමය නැති කර දමන ලදි. මෙමගින් ඕනෑ ම පුද්ගලයකුට තමාට අභිමත රැකියාවක් තෝරා ගැනීමේ නිදහස උදා විය. නීතිය අභිමුඛයෙහි සෑම කුලයක ම ජනයා එක සමාන විය. මෙමඟින් වැඩවසම් ක්‍රමය බිඳ වැටී වර්තමානයේ නිදහස් සමාජය ගොඩ නැඟීම සිදු විය.[11] කෝල්බෲක් රාජකාරී ක්‍රමය අහෝසි කරන ලෙස යෝජනා කෙළේ හේතු කිහිපයක් පදනම් කර ගෙන ය. රාජ්‍ය නිර්බාධවාදය වැනි නව ආර්ථික න්‍යායන්ගෙන් ආභාසය ලැබූ කෝල්බෲක් රාජකාරි ක්‍රමය රටේ කෘෂිකර්මාන්තයේ හා වාණිජ කටයුතුවල වර්ධනයට හා නිදහස් ශ්‍රමයට බාධාකාරී මෙන් ම විනාශකාරී ලෙස ද බල පා ඇති බව දුටුවේ ය. මේ ක්‍රමය තුළ නිදහස් ශ්‍රමයට අවකාශයක් නොතිබිණි. පුද්ගලයා ඉඩමට බැඳ තබන ක්‍රමයක් විය. මේ තුළ පුද්ගලයාට වෙනත් ප්‍රදේශයකට ගොස් පදිංචි වීමට බාධා වීම පමණක් නොව පුද්ගලයා එක ම වෘත්තියකට පමණක් බැඳ තබන බව හෙතෙම ප්‍රකාශ කෙළේ ය.[12] රාජකාරි ක්‍රමය මත රජයෙන් ජනතාවට ලබා දී තිබූ ඉඩම් නැවත ලබා ගෙන වාණිජ ව්‍යාපාරිකයන්ට ලබා දීමට ඉංග්‍රීසිහු කටයුතු කළහ.[13]

---

8. කරුණානන්ද,උක්කු බණ්ඩා , ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය, 1999 : 89.
9. Pieris, Ralph, Society and Ideology.1951:174.
10. ද සිල්වා .එම්.යූ, ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය 1998: 26.
11. මොරගොඩ , පින්තු නිව්ටන් , ලංකාව හා ලෝක ඉතිහාසය, 1967: 09.
12. කරුණානන්ද, ඉහත සඳහන් කෘතිය,1999: 27.
13. Samaraweera, Wijeya, The Development of the Administrative System from 1802-1832 1973 : 35.

ආර්ථික තත්ත්වය විමසීමේ දී ලංකාවේ පෘතුගීසි පාලන යුගය ද වැදගත් වේ. එම කාල පරිච්ඡේදය තුළ රටෙහි පැවති විවිධ අරාජික තත්ත්වයන් හමුවෙහි කෘෂිකර්මාන්තාදියට අවශ්‍ය වාරි කර්මාන්ත කෙරෙහි අවධානයක් නොදැක්වීම හේතුවෙන් ස්වයංපෝෂිත ආර්ථික රටාව ශීඝ්‍රයෙන් පිරිහෙන්නට විය.[14] පෘතුගීසි සමය තුළ නොසලකා හැර තිබූ කෘෂි කර්මාන්තය කෙරෙහි ලන්දේසි සමය තුළ අවධානය යොමු විය. ආර්ථික තත්ත්වය නංවාලීම සඳහා අලුත් මෙන් ම පැරණි ක්‍රම ද උපයෝගි කර ගත් අයුරක් ලන්දේසි කාල පරිච්ඡේදයේ දී දැක ගත හැකියි. ලන්දේසි පාලන සමය තුළ දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ වෙළඳ කටයුතු දියුණු හා පුළුල් වූවා පමණක් නොව ධනවාදි ආර්ථික ක්‍රමයකට අවශ්‍ය වන ශ්‍රමය විකුණා ජීවත් වන කම්කරු පංතියක මූලාරම්භය ද සිදු විය.[15]

ක්‍රි.ව. 1796 දී දිවයිනේ මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට යටත් වන අවස්ථාව වන විට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය බිඳ වැටී තිබිණි.[16] බ්‍රිතාන්‍යයන් මුහුදුබඩ ප්‍රදේශය තමන් සතු කර ගන්නා විට පොල්, කෝපි හා ගම්මිරිස් මෙරට ප්‍රධාන වගාවන් වූ නමුත් වැදගත් වාණිජ වගාවන් වසයෙන් නොසැලකිණි. එසේ වුවත් ඉංගිරිසීහු ඔවුන් මුහුණ පෑ මූල්‍ය අර්බුද ජය ගැනීම සඳහා වාණිජ වගාවන් දියුණු කිරීමට ප්‍රෝත්සාහි වූහ.[17] 19 වන ශතවර්ෂය ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකය ප්‍රධාන තන්හි ලා සැලකිය හැකි ය.[18] බ්‍රිතාන්‍යයන් විසින් දිවයිනට හඳුන්වා දෙනු ලැබූ නව වැවිලි භෝග වගා අතර කෝපි, පොල්, තේ සහ රබර් යන වගා ශීඝ්‍රයෙන් වර්ධනය වන්නට විය.[19] ක්‍රි.ව 1810 දී යුරෝපීයයන් මෙරට ඉඩම් මිල දී ගැනීම වැළැක්වීමට පනවා තිබූ සියලු නියෝග ඉවත් කිරීමත් සමග රජයේ සේවකයන් ඉඩම් මිල දී ගැනීමටත් වතු වගාවට සම්බන්ධ වීමත් දැක ගත හැකි යි. 1824-1829 දී පනවනු ලැබූ විශේෂ නියෝගයක් අනුව සියලු ම වාණිජ නිෂ්පාදකයෝ රජයේ බදුවලින් නිදහස් කරනු ලැබූහ. මේ අනුව කෝපි, උක්, ඉන්ඩිගෝ හා අබිං යන නිෂ්පාදන දොළොස් අවුරුදු කාල සීමාවකට සියලු බදුවලින් නිදහස් කරන ලදි. මෙහි ප්‍රතිඵලය වූයේ ගොවීන්ගේ

---

14. ඇඳගම,මාලනී, බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වර්ධනයේ පදනම ,1796-1832, ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය (ලං.බ්‍රි,ඉ) සංස්: ජී. පී. වී, සෝමරත්න,1991: 174.
15. -එම-, 1991: 175-176.
16. -එම-, 1991: 177

17. හෙට්ටිආරච්චි,තිලක්, දහනව වැනි සියවසේ ගොවි ජනතාව සහ වාණිජ කර්මාන්ත, ලං,බ්‍රි,ඉ, 1991: 24.

18. De Silva K.M , Social Policy and Missinary Organization in Ceylon (1840-1855) 1965: 08.
19. De Silva, K.M, (HOP), 1981: 285.